මගේ අංකය / எனது இல. / My No. RG/NB/11/2/35/පොදු/3

ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. 2889488, 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491

ඊ මේල් / மின்னஞ்சல் / E-mail info@rgd.gov.lk, rg@rgd.gov.lk

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

234/A3, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

(59)

# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகத் திணைக்களம்
# REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
**HEAD OFFICE**

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site www.rgd.gov.lk

දිනය / திகதி / Date. 2014.06. ०६

සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

**සාමාන්‍ය පත්‍රිරුවල (ලි.ප. A4 ආකෘතිය) ලියාපදිංචි විය යුතු, වැරදීමකින් එල්.ඩී.ඕ. පත්‍රිරුවල ලියාපදිංචි කර ඇති සටහන් නිවැරදි කිරීම සම්බන්ධවයි.**

ඉඩම් සංවර්ධන ආඥා පනතේ 159(ආ) උප වගන්තියට අදාල නිදහස් දීමනා පත්‍ර සාමාන්‍ය පත්‍රිරුවල (ලි.ප. A4 ආකෘතිය) ලියාපදිංචි විය යුතුය. එසේ වුවත් වැරදීමකින් එල්.ඩී.ඕ. පත්‍රිරුවල ලියාපදිංචි කර ඇති අවස්ථා වලදී එම ලියාපදිංචි සටහන් ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 35 වන වගන්තිය යටතේ සාමාන්‍ය පත්‍රිරුවට(ලි.ප. A4 ආකෘතිය) මාරු කර සටහන් යෙදීම සඳහා මා වෙත ලැබෙන ඉල්ලීම් ප්‍රමාණය දිනෙන් දින වැඩි වී ඇත. නමුත් මෙම සටහන් එල්.ඩී.ඕ. පත්‍රිරුවලින් සාමාන්‍ය පත්‍රිරුවකට මාරු කිරීමේදී දිනපොත් අංක සටහන් කිරීම ගැටළු සහගත වී ඇත.

02. බොහෝ විට මෙම තත්ත්වය අනාවරණය වන්නේ අදාල දේපල බැහැර කිරීම් සඳහා ඉදිරිපත් කරනු ලබන අවස්ථා වලදී ඔප්පුව ලියාපදිංචි කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අවසරය ලබාගෙන ඉදිරිපත් කරන ලෙස දැන්වීමෙන් පසුවයි. එබැවින් මින් ඉදිරියට එවැනි ඉඩම සම්බන්ධයෙන් ලේඛනයක් ලියාපදිංචි කිරීම සඳහා ලදවිට අදාල පත්‍රිරුවෙහි සඳහන් විස්තර සාමාන්‍ය පත්‍රිරුවකට(ලි.ප. A4 ආකෘතියට) ගෙන ගොස් ලියාපදිංචි කිරීමට පියවර ගන්න. ඒ සඳහා ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 35 වන වගන්තිය යටතේ කටයුතු කිරීම අවශ්‍ය නොවන බව වැඩිදුරටත් දන්වමි.

රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවට

**රංජිත් දයානන්ද**
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
අංක. 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත,
බත්තරමුල්ල.

පිටපත් : සියළුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් වෙත - දැන ගැනීම සඳහා